# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1885/38 - 2014 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2014.10.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1994.10.31 දිනැති 843/4 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයට 1995.04.03 දිනැති අංක 865/3 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් 1997.03.11 දිනැති අංක 966/5 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් සහ 1997.05.14 දිනැති අංක 975/6 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රය* මගින් වරින් වර කරන ලද සංශෝධන අනුව ගන්නා ලද හෝ ඒ යටතේ ගන්නා ලදැයි අදහස් කරන ලද හෝ කිසියම් පියවරකට හානියක් නොවන පරිදි පහත දැක්වෙන ශ්‍රී ලංකා ගුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය ආදේශ කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 ඔක්තෝබර් මස 23 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
"ඉසුරුපාය"
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

**01. ක්‍රියාත්මකවන දිනය :**

මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2008.07.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (viii) හි 06 ඡේදයේ දැක්වෙන වැටුප් ක්‍රම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2010 හි 2.3 ඡේදයේ දැක්වෙන විධිවිධානවලට යටත්ව 2011.01.01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

**02. පත් කිරීම් බලධරයා :**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද අධ්‍යාපන විෂයය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්.

1A - PG 2216 — 250 (2014/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**03. සේවා ගණය/ සේවා ගණ :**

3.1 . සේවා ගණය : ශ්‍රී ලංකා ගුරු සේවය.

3.2 . ශ්‍රේණිː

3 පන්තිය - II ශ්‍රේණිය
3 පන්තිය - I (ඇ) ශ්‍රේණිය
3 පන්තිය - I (ආ) ශ්‍රේණිය
3 පන්තිය - I (අ) ශ්‍රේණිය

2 පන්තිය - II ශ්‍රේණිය
2 පන්තිය - I ශ්‍රේණිය
1 පන්තිය.

**04. සේවාවේ පොදු කාර්යය භාරය :**

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූලව ඉහළ ගුණාත්මක භාවයෙන් යුත් අධ්‍යාපනයක් තුළින් පරිපූර්ණ පුරවැසියෙක් බිහි කිරීම පිණිස රජයේ පාසල්වල ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම, පාසල් අධ්‍යාපනයට අදාළ ජාතික මට්ටමේ සහ අනෙකුත් විභාග හා ඇගයීම් පැවැත්වීමට අදාළ කාර්යය, පාසල්වල විෂයය සමගාමී කාර්යය සහ රජය විසින් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළව පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු යැයි තීරණය කරනු ලබන කාර්යය ගුරුවරුන් විසින් ඉටු කළ යුතු වේ.

**05. වැටුප් :**

5.1 වැටුප් කේත අංක.

| | | |
|---|---|---|
| 5.1.1 | 3 පන්තිය - II ශ්‍රේණිය<br>3 පන්තිය - I (ඇ) ශ්‍රේණිය<br>3 පන්තිය - I (ආ) ශ්‍රේණිය<br>3 පන්තිය - I (අ) ශ්‍රේණිය | ජී. ඊ. - 1 - 2006 |
| | 2 පන්තිය - II ශ්‍රේණිය<br>2 පන්තිය - I ශ්‍රේණිය<br>1 පන්තිය. | ජී. ඊ. - 2 - 2006 |

5.1.1.1. වැටුප් පරිමාණය.

ජී. ඊ. - 1 - 2006 වැටුප - රු. 13,410-145 x 6-180 x 1-15,755
ජී. ඊ. - 2 - 2006 වැටුප - රු. 16,100-240 x 5-330 x 5-400 x 7-645 x 20-34,650

5.1.1.2. ශ්‍රේණි ක්‍රමය සහ අදාළ ආරම්භක වැටුප් පියවර.

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය |
|---|---|---|
| ජී .ඊ. - 1 - 2006 | | |
| 3 පන්තිය - II ශ්‍රේණිය | පියවර 01 | රු. 13,410 |
| 3 පන්තිය - I (ඇ)ශ්‍රේණිය | පියවර 07 | රු. 14,280 |
| 3 පන්තිය - I (ආ)ශ්‍රේණිය | පියවර 09 | රු. 14,640 |
| 3 පන්තිය - I (අ)ශ්‍රේණිය | පියවර 14 | රු. 15,540 |
| ජී .ඊ. - 2 - 2006 | | |
| 2 පන්තිය - II ශ්‍රේණිය | පියවර 01 | රු. 16,100 |
| 2 පන්තිය - I ශ්‍රේණිය | පියවර 11 | රු. 18,950 |
| 1 පන්තිය | පියවර 18 | රු. 21,750 |

*සටහන - 1* මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන 2008.07.01 දිනට ප්‍රථමයෙන් ගුරු සේවයේ 3- I ශ්‍රේණියේ සිටින 13.9 (අ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන්ගේ වැටුප ජී ඊ - 1 - 2006 වැටුප් පරිමාණයෙහි උපලේඛන II අනුව සිදු කළ

යුතු ය. එම ගුරුවරුන්ගේ වැටුප 2015.01.01 දින සිට ජී ඊ - 1 - 2006 වැටුප් පරිමාණයෙහි පියවර එකොළහ (11) සිට පියවරෙන් පියවර ක්‍රමයට පරිවර්තනය කළ යුතු ය. 2015.01.01 දින සිට ගුරු සේවයේ 3- I (ආ) ශ්‍රේණියට බඳවා ගන්නා ගුරුවරුන්ගේ ආරම්භක වැටුප ජී ඊ - 1 - 2006 වැටුප් පරිමාණයෙහි රුපියල් 15,000ට අදාළ වැටුප් පියවර වේ.

*සටහන - 2* මෙම සේවයේ 3-I (ඇ), 3-I (ආ) හෝ 3-I (අ) ශේණිවල ගුරුවරුන්ඃ මෙම ශ්‍රේණිවල සිට 2- II ශ්‍රේණියට පත් කිරීමේ දී 2- II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබේ.

*සටහන - 3* මෙම සේවයේ 3-I ශ්‍රේණියට බඳවා ගත් පුහුණු ගුරුවරුන්ඃ මෙම ගුරුවරුන් උපාධි සුදුසුකම ලබා ගත් විට 2- II ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එම ශ්‍රේණියේ වැටුප් පරිමාණයෙහි තුන් (03) වැනි වැටුප් පියවරෙහි තබනු ලැබේ.

*සටහන - 4* මෙම සේවයේ 3-I ශ්‍රේණියට බඳවා ගත් ශික්ෂණ විද්‍යා පුහුණුව නොලද උපාධිධාරී ගුරුවරුන්ඃ මෙම ගුරුවරුන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම සහ අධ්‍යාපන පශ්චාත් උපාධි සුදුසුකම ලබා ගත් විට 2- II ශ්‍රේණියට බඳවා ගැනීමෙන් පසු එම වැටුප් පරිමාණයෙහි පස් (05) වැනි වැටුප් පියවරෙහි තබනු ලැබේ.

*සටහන - 5* සේවයේ 2- II ශ්‍රේණියට බඳවා ගැනීමේ දී වැටුප් පරිමාණයේ පිහිටුවීමඃ පහත 7.2.2.1 ඉ හි සඳහන් සුදුසුකම් ලද තැනැත්තන් 2- II ශ්‍රේණියේ වැටුප් පරිමාණයෙහි තුන් (03) වන වැටුප් පියවරෙහි පිහිටුවනු ලැබේ.

**06. සේවයට අයත් තනතුරු :**

6.1. අනුමත තනතුරු සංඛ්‍යාව සහ ඒවාට පැවරෙන කාර්යය :

| *අනුමත තනතුරු නාමය* | *අනුමත ඒකාබද්ධ තනතුරු සංඛ්‍යාව* | *කාර්යය* |
|---|---|---|
| ගුරු සේවයේ 3-II, 3-I, 2-II, 2-I, 1, | 31317 | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව රජයේ පාසල්වල ඉගෙනුම් සහ ඉගැන්වීමේ කාර්යය, පාසල් අධ්‍යාපනයට අදාළ ජාතික මට්ටමේ සහ අනෙකුත් විභාග පැවැත්වීමට අදාළ කාර්යය, පාසල්වල ක්‍රීඩා සහ අනෙකුත් විෂයය සමගාමී කාර්යයන් සහ රජය විසින් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ පාසල් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු යැයි තීරණය කරනු ලබන කාර්යය ඉටු කිරීම. |

*6.2. ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව.*
ගුරු සේවයේ 3 -II, 3 -I (අ), 3 -I(ආ), 3 -I(ඇ), 2-II, 2-I, සහ I වශයෙන් පන්ති සහ ශ්‍රේණි ව්‍යුහයකින් සමන්විත වේ. අනුමත ඒකාබද්ධ තනතුරු සංඛ්‍යාව 31317 වේ.

*6.3. තනතුරෙහි/ තනතුරුවල ස්වභාවයඃ*
ස්ථිර විශ්‍රාම වැටුප් සහිත.

**07. බඳවා ගැනීමේ ක්‍රමය :**

7.1 බඳවා ගන්නා අනුපාතය.

| *ධාරාව* | *ප්‍රතිශතය* |
|---|---|
| විවෘත<br>සීමිත | 100%<br>අදාළ නැත |

*7.2 විවෘත බඳවා ගැනීම.*

*7.2.1. බඳවා ගන්නා ශ්‍රේණිය :*

| | | |
|---|---|---|
| (i) | අධ්‍යාපනවේදී උපාධිධාරීන් (13.8) | - 2 පන්තිය - II ශ්‍රේණිය |
| (ii) | උපාධිධාරීන් (13.7) | - 3 පන්තිය - I (අ)ශ්‍රේණිය |
| (iii) | ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන්(13.9 (අ)) | - 3 පන්තිය - I (ආ)ශ්‍රේණිය |
| (iv) | ඩිප්ලෝමාධාරීන් (13.11) | - 3 පන්තිය - I (ඇ)ශ්‍රේණිය |
| (v) | අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම් ලැබූවන් (13.13) | - 3 පන්තිය - II ශ්‍රේණිය |

*7.2.2 සුදුසුකම් :*

7.2.2.1. අධ්‍යාපන සුදුසුකම්

(අ) 3 පන්තිය - II ශ්‍රේණිය
ව්‍යවස්ථාවේ 13.13 හි සඳහන් පරිදි සුදුසුකම් ලැබූවන්

(ආ) 3 පන්තිය - I (ඇ)ශ්‍රේණිය
ව්‍යවස්ථාවේ 13.11 හි සඳහන් පරිදි සුදුසුකම් ලැබූවන්

(ඇ) 3 පන්තිය - I (ආ)ශ්‍රේණිය
ව්‍යවස්ථාවේ 13.9 (අ) හි සඳහන් පරිදි සුදුසුකම් ලැබූවන්

(ඈ) 3 පන්තිය - I (අ)ශ්‍රේණිය
ව්‍යවස්ථාවේ 13.7හි සඳහන් පරිදි සුදුසුකම් ලැබූවන්

(ඉ) 2 පන්තිය - II ශ්‍රේණිය
(i) ව්‍යවස්ථාවේ 13.8 හි සඳහන් පරිදි සුදුසුකම් ලැබූවන්
(ii) ව්‍යවස්ථාවේ 13.7 හි සඳහන් සුදුසුකම සමග 13.9 හි සඳහන් සුදුසුකම් ලැබූවන්
(iii) ව්‍යවස්ථාවේ 13.7 හි සඳහන් සුදුසුකම සමග 13.14 හි සඳහන් සුදුසුකම් ලැබූවන්

*සටහන - 6* සෑම අයදුම්කරුවකුම 7.2.2.1 හි සඳහන්වන සුදුසුකම්වලට අමතර ව අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී සිංහල භාෂාව හෝ දෙමළ භාෂාව විෂයයක් වශයෙන් සමත් වී තිබිය යුතු ය.

7.2.2.2 කායික හා මානසික යෝග්‍යතාවය.
සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.2.2.3. වයස.
7.2.2.3.1 අවම සීමාව : අවුරුදු 18 යි.
7.2.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35 යි.

7.2.2.4 අනෙකුත් අවශ්‍යතා.
(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ආ) අයදුම්කරු විශිෂ්ඨට චරිතයකින් යුක්ත විය යුතු ය.
(ඇ) ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.
(ඈ) සුදුසුකම් ලබන දිනය - ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට/සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේනම් පමණි.

*7.2.3 බඳවා ගැනීමේ ක්‍රමය :*

7.2.3.1. 3 පන්තිය II ශ්‍රේණිය

සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරග විභාගය සහ 7.2.4.4.1(1) හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.4.1(2) හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත 13.18 හි පරිදි පාසල් පාදකව සිදු කරනු ලැබේ.

7.2.3.2. 3 පන්තිය I (ඇ) ශ්‍රේණිය
සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරග විභාගය සහ 7.2.4.4.1(1) හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.4.1(2) හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත 13.18 හි පරිදි පාසල් පාදකව සිදු කරනු ලැබේ.

7.2.3.3. 3 පන්තිය I (ආ) ශ්‍රේණිය
සේවයට බඳවා ගැනීම 7.2.4.4.1(1)හි සඳහන් පරිදි සමාන්‍ය සම්මුඛ පරීක්ෂණය මත 13.18 හි පරිදි පාසල් පාදකව සිදු කරනු ලැබේ.

7.2.3.4. 3 පන්තිය I (අ) ශ්‍රේණිය
සේවයට බඳවා ගැනීම 7.2.4.1 හි සඳහන් පරිදි ලිඛිත තරග විභාගය සහ 7.2.4.4.1(1)හි සඳහන් පරිදි, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.4.1(2) හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත 13.18 හි පරිදි පාසල් පාදකව සිදු කරනු ලැබේ.

7.2.3.5. 2 පන්තිය - II ශ්‍රේණිය
සේවයට බඳවා ගැනීම 7.2.4.4.1(1) හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සහ 7.2.4.4.1(2) හි සඳහන් පරිදි ප්‍රායෝගික පරීක්ෂණය මත 13.18 හි පරිදි පාසල් පාදකව සිදු කරනු ලැබේ.

7.2.4 *විභාග ක්‍රමය :*

7.2.4.1. ලිඛිත තරග විභාගය –

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය - (කාලය පැය 01යි) | 100 | 40 |
| සාමාන්‍ය දැනීම - (කාලය පැය 01 යි) | 100 | 40 |

"අ" පරිශිෂ්ඨය බලන්න

7.2.4.1.1. පවත්වන බලධරයාඃ විභාග කොමසාරිස් ජනරාල්

7.2.4.2. ප්‍රායෝගික පරීක්ෂණය.
අයදුම්කරු විසින් හඳුනාගත් මාතෘකාවක් යටතේ විනාඩි පහ (5)කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් සිදු කළ යුතු වේ. මෙහිදී ලකුණු විසි පහ (25)ක් ලබා දෙනු ලැබේ.

"ආ" පරිශිෂ්ඨය බලන්න.

7.2.4.3. *තෝරා ගැනීමේ ක්‍රමය :*

සම්මුඛ පරීක්ෂණය සඳහා ලිඛිත තරග විභාගයේ දී ඔවුන් විසින් ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල හා අදාළ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් පස් (05) ගුණයක් කැඳවනු ලබන අතර, ඉන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. තෝරා ගැනීම "අ" පරිශිෂ්ඨය අනුව සිදු කරනු ලැබේ.

(අ) ව්‍යවස්ථාවේ 7.2.3.2., 7.2.3.4. සහ 7.2.3.5. සඳහන් විධි විධාන යටතේ බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ ක්‍රමය.

(i) ලිඛිත විභාගයේ විෂයයන් දෙක (2)ම සමත් වන අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ ලකුණුවල එකතුව මත කුසලතා අනුපිළිවෙල අනුව ඒ ඒ පාසලේ පවතින පුරප්පාඩු සංඛ්‍යා අනුව බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව මෙන්, තුන් (3) ගුණයක් එම පාසලට ඉල්ලුම් කළ අය අතරින් ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලබන්නේ 7.2.4.4.1(1) හි සඳහන් පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් පමණි.

(ii) ව්‍යවස්ථාවේ 7.2.4.1 හි සඳහන් ලිඛිත පරීක්ෂණයෙන් සමත් හා 7.2.4.4.1(2) හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ඔවුන් ලබාගත් ලකුණුවල එකතුව අනුව ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල තීරණය කරනු ලැබේ. ඒ අනුව පාසල් පාදක ව ස්ථානගත කෙරේ.

(iii) ඉහත 7.2.4.3 (i) හි සඳහන් ක්‍රියාවලිය පරිදි ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවන අයදුම්කරුවන් අතරින් යම් පාසලකට සුදුසුකම් ලැබූවන් නොමැති අවස්ථාවක දී 7.2.4.4.1(2) හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවීම් නොකළ එම පාසලට ඉල්ලුම් කළ 7.2.4.1 හි සඳහන් ලිඛිත විභාගය සමත් අය අතරින් නැවත 7.2.4.3 (i) හි ක්‍රියාවලිය අනුගමනය කර තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

(iv) යම් පාසලකට කිසිදු අයදුම්කරුවකු ඉල්ලුම්කර නොමැති අවස්ථාවක දී හෝ කිසිදු අයදුම්කරුවකු ලිඛිත විභාගය සමත්ව නොමැති අවස්ථාවක දී හෝ බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව අනුව ලිඛිත විභාගය සමත් වූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක දී හෝ එබඳු පාසලක් සඳහා බඳවාගනු ලබනුයේ වෙනත් පාසල් සඳහා අයදුම් කර 7.2.4.1 හි සඳහන් ලිඛිත විභාගය සහ 7.2.4.4.1(2)හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණය සමත් වූ අය අතරින් කැමැත්ත විමසා ඔවුන් ලබාගෙන ඇති කුසලතා අනුපිළිවෙල මත තෝරා ගනු ලැබීමෙනි.

(ආ) ව්‍යවස්ථාවේ 7.2.3.1 හි සඳහන් විධි විධාන යටතේ බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ ක්‍රමය.

(i) ඒ ඒ පාසල සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් අතුරින් 7.2.4.4.1(1) හි පරිදි සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් 7.2.4.4.1(2) හි පරිදි ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(ii) ව්‍යවස්ථාවේ 7.2.4.4.1(2) හි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණය සමත් අයදුම්කරුවන් ඔවුන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදු කර පාසල් පාදක ව ස්ථාන ගත කෙරේ.

(ඇ) ව්‍යවස්ථාවේ 7.2.3.3 හි සඳහන් විධි විධාන යටතේ බඳවා ගැනීම සඳහා වූ තෝරා ගැනීමේ ක්‍රමය.

(i) ඒ ඒ පාසල සඳහා ඉල්ලුම් කළ අයදුම්කරුවන් සියලු දෙනා 7.2.4.4.1(1) හි සඳහන් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ප්‍රතිඵල ලේඛනයේ සඳහන් කුසලතා අනුපිළිවෙළ අනුව තෝරා ගැනීම සිදු කර පාසල් පාදක ව ස්ථාන ගත කරනු ලැබේ.

සටහන 7 - පාසල් පාදක ක්‍රමය අනුව බඳවා ගැනීමේ දී පළමු පත්වීම ලබන පාසලේ සේවය කළ යුතු කාල පරිච්ඡේදය බඳවා ගන්නා අවස්ථාවේ දී පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

7.2.4.4. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයඃ ලකුණු ලබා දෙනු නොලැබේ.

7.2.4.4.1 ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු.

(1) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය.
සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූල ව ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

(2) ප්‍රායෝගික පරීක්ෂණය.
ගුරු වෘත්තියේ දී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාවය මැන බැලීම.

7.2.4.4.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධාරියාඃ-
අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම්.

7.2.5 *අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :*

රජයේ ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් හෝ පුවත්පත් දැන්වීමක් මගින් සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින්.

7.2.6. *ශ්‍රේණියක සිට තවත් ශ්‍රේණියකට පත් කිරීම :*

**7.2.6.1. සේවයේ 3- II ශ්‍රේණියේ සිට 3- I ශ්‍රේණියට පත් කිරීම**

(i) විධිමත් පරිදි උපාධි සුදුසුකම් ලබා ගත් විට 3- I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) ගුරු පුහුණුව සම්පූර්ණ කළ විට 3- I (ආ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.6.2. **සේවයේ 3- II ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියට පත් කිරීම**

(i) 2- II ශ්‍රේණියට පත් කිරීම සඳහා අවශ්‍ය ඉහත 7.2.2.1 (ඉ) හි සඳහන් සුදුසුකම් ලබා ගතහොත් 2- II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.6.3. **සේවයේ 3- I (ඇ) ශ්‍රේණියේ පත්වීම් ලද ගුරුවරුන් ඉහළ ශ්‍රේණිවලට පත් කිරීම**

(i) උපාධි සුදුසුකම් ලබා ගත්විට 3- I (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ii) ගුරු පුහුණුව සම්පූර්ණ කළ විට 3- I (ආ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.6.4 **සේවයේ 3- I (ඇ) ශ්‍රේණියේ පත්වීම් ලද ගුරුවරුන් 2- II ශ්‍රේණියට පත් කිරීම**

(i) 2- II ශ්‍රේණියට පත් කිරීම සඳහා අවශ්‍ය ඉහත 7.2.2.1 (ඉ) හි සඳහන් සුදුසුකම් ලබා ගතහොත් 2- II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.6.5 **සේවයේ 3- I (ආ) ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියට පත් කිරීම**

(i) 2- II ශ්‍රේණියට පත් කිරීමේ සුදුසුකම් (උපාධිය සමත් විට) ලබා ගතහොත් ඒ අනුව එම ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.6.6 **සේවයේ 3- I (අ) ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියට පත් කිරීම**

(i) අධ්‍යාපන විෂයයට අදාළව පශ්චාත් උපාධි සුදුසුකම් ලබා ගත් විට 2- II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

7.2.6.7. **පත් කිරීමේ ක්‍රමය**

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් අදාළ ශ්‍රේණියට පත් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ශ්‍රේණියට පත් කිරීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

**08. කාර්යක්ෂමතා කඩඉම් :**

(අ) සේවයේ ගුරුවරුන් පහත දැක්වෙන පරිදි නියමිත කාර්යක්ෂමතා කඩඉම් සම්පූර්ණ කළ යුතු ය.

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | ශ්‍රේණිය | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | සම්පූර්ණ කළ යුතු පැය ගණන | සම්පූර්ණ කළ යුතු මොඩියුල |
|---|---|---|---|---|
| I වන කාර්යක්ෂමතා කඩඉම | 3 පන්තිය II ශ්‍රේණිය | අදාළ ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර | | ගුරු පුහුණු සහතිකය |
| | 3 පන්තිය I ශ්‍රේණිය | අදාළ ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර | පැය96 | 1-7(I) |
| | 2 පන්තිය II ශ්‍රේණියට සෘජුව බඳවාගත් ගුරුවරුන් | අදාළ ශ්‍රේණියට පත් වී වසර තුනක් (03) ගත වීමට පෙර | පැය96 | 1-7(II) |
| II වන කාර්යක්ෂමතා කඩඉම | 2 පන්තිය II ශ්‍රේණියේ 1 පියවරෙහි පිහිටුවනු ලැබූවන් සඳහා | වසර හතරක් (04) ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතු ය. | පැය112 | 8-14 |
| | 2 පන්තිය II ශ්‍රේණියේ තුන්වන පියවරෙහි පිහිටුවනු ලැබූවන් සඳහා | වසර හතරක් (04) ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතු ය. | පැය112 | 8-14 |

:

*සම්බන්ධිතයි*

| | | | | |
|---|---|---|---|---|
| | 2 පන්තිය II ශ්‍රේණියේ පස්වන පියවරෙහි පිහිටුවනු ලැබූවන් සඳහා | වසර හතරක් (04) ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතු ය. | පැය112 | 8-14 |
| III වන කාර්යක්ෂමතා කඩඉම | 2 පන්තිය I ශ්‍රේණිය | 2-I ශ්‍රේණියට උසස් වී වසර හතරක් (04) ඉක්ම යාමට පෙර සම්පූර්ණ කළ යුතු ය. | පැය112 | 15-20 |

*සටහන 8 -* ව්‍යවස්ථාවේ 13.8හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම මත සේවයේ 2 පන්තිය II ශ්‍රේණියට සෘජුව බඳවාගත් ගුරුවරුන් හැර අනෙකුත් ගුරුවරුන් සඳහා පමණක් දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය අදාළ වේ.

(ආ) කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම සඳහා අදාළ අනෙකුත් විධිවිධාන.

(i) සේවයේ 3 පන්තිය සඳහා බඳවාගත් ගුරුවරුන් 2 පන්තියේ II ශ්‍රේණියට උසස් වීම සඳහා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සමත් විය යුතු ය. එහෙත් ව්‍යවස්ථාවේ 7.2.6.2, 7.2.6.4, 7.2.6.5 හා 7.2.6.6 හි සඳහන් විධිවිධාන යටතේ 2 පන්තියේ II ශ්‍රේණියට පත්වන අවස්ථාවක දී 3 වන පන්තියට නියමිත කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබීම අවශ්‍ය නොවේ. එහෙත් එලෙස පත් වූ ගුරුවරුන් 2 පන්තියේ II ශ්‍රේණියේ දී සේවයේ මුල් පත්වීමේ දින සිට වසර 3ක් තුළ දී පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය. ඊට අමතරව ඔවුන් 2 පන්තියේ II ශ්‍රේණියට නියමිත දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2 පන්තියේ II ශ්‍රේණියට උසස් වූ දින සිට වසර හතරක් (4) තුළ දී සම්පූර්ණ කළ යුතු ය.

.

(ii) ව්‍යවස්ථාවේ 13.8 හි සඳහන් අධ්‍යාපනවේදී උපාධි සුදුසුකම් මත සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට සෘජුව බඳවා ගත් ගුරුවරුන් සඳහා අදාළ වනුයේ පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයයි.

(ඇ) කාර්යක්ෂමතා කඩඉම සඳහා නියමිත මොඩියුල "ඈ" පරිශිෂ්ඨයේ සඳහන් වේ. මෙම මොඩියුල අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් අවශ්‍යතාවය මත වරින් වර සංශෝධනය කරනු ලැබේ.

**9. භාෂා ප්‍රවීණතාව :**

| *භාෂාව* | *ලබා ගත යුතු ප්‍රවීණතාව* |
|---|---|
| 01 රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා තිබිය යුතු ය. |
| 02 අනෙකුත් රාජ්‍ය භාෂා | රා.ප.ච. 01/2014 අනුව අදාළ භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතු ය. |

**10. ශ්‍රේණි උසස් කිරීම් :**

10.1. සේවයේ 3- I (ආ) ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියට උසස් කිරීම

10.1.1. *සාමාන්‍ය කාර්ය සාධනය අනුව :*

10.1.1.1. *සපුරාලිය යුතු සුදුසුකම් :*

(i) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 3- I (ආ) ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
(ii) පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීම.

(iii) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

(iv) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

10.1.1.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් අදාළ ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ශ්‍රේණියට උසස් කිරීම අධ්‍යාපන විෂයභාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

10.2. සේවයේ 3- I (අ) ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියට උසස් කිරීම

10.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.2.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 3- I (අ) ශ්‍රේණියේ අවම වශයෙන් වසර තුනක (03) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(ii) පළමු කාර්යක්ෂමතා කඩඉම සමත්වීම.

(iii) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර තුන (03) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(iv) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර තුන (03) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.2.1.2. උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් අදාළ ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අදාළ ශ්‍රේණියට උසස් කිරීම අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

10.3. 2- II ශ්‍රේණියේ සිට 2- I ශ්‍රේණියට උසස් කිරීම :

මෙම උසස් කිරීමේ ක්‍රියාවලිය කොටස් හතරකට වර්ග කෙරේ. එම උසස් කිරීමේ ක්‍රියාවලිය 10.3.1, 10.3.2, 10.3.3 හා 10.3.4 වශයෙන් පහත දැක්වේ.

10.3.1. සේවයේ 3- I ශ්‍රේණියේ සිට 2- II ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවා උසස් කරනු ලබන්නන් 2- II ශ්‍රේණියේ සිට 2- I ශ්‍රේණියට උසස් කිරීම

10.3.1.1. සාමාන්‍ය කාර්යසාධනය අනුව

10.3.1.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

(i) මෙම සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.

(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට 2- II ශ්‍රේණියේ අවම වශයෙන් වසර නවයක් (09)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක නවයක් (09) උපයාගෙන තිබීම.

(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

(iv) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර නවයක් (09) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

(v) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.3.1.1.2. උසස් කිරීමේ ක්‍රමය.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2- I ශ්‍රේණියට උසස් කිරීම අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

10.3.2. ගුරු පුහුණුව සමග උපාධි සුදුසුකම් මත 2- II ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ තුන්වන පියවරට බඳවා ගත් 2- II ශ්‍රේණියේ ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම.

10.3.2.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.3.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්.

(i) මෙම සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.
(ii) උසස් කිරීම සඳහා සුදුසුකම් ලබන දිනට 2- II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07)ක් උපයාගෙන තිබීම.
(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.
(iv) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්යසාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර හත (07) තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
(v) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.3.2.1.2. උසස් කිරීමේ ක්‍රමය

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2- I ශ්‍රේණියට උසස් කිරීම අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

10.3.3 උපාධිය සමග පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ අධ්‍යාපනවේදී උපාධිය සුදුසුකම් මත 2- II ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ තුන්වන පියවරට බඳවාගත් 2- II ශ්‍රේණියේ ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම.

10.3.3.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව.

10.3.3.1.1. සපුරාලිය යුතු සුදුසුකම්.

(i) මෙම සේවයේ පත්වීම ස්ථිර කර තිබීම.
(ii) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම සේවයේ 2- II ශ්‍රේණියේ අවම වශයෙන් වසර හත (07)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක හත (07)ක් උපයාගෙන තිබීම.
(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.
(iv) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර හත (07)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
(v) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.3.3.1.2. උසස් කිරීමේ ක්‍රමය.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2- I ශ්‍රේණියට උසස් කිරීම අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

10.3.4 . ප්‍රථම උපාධිය සහ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම්/ පශ්චාත් උපාධියක් සමග ගුරු පුහුණුව මත 2- II ශ්‍රේණියට නියමිත වැටුප් ක්‍රමයේ පස්වන (05) පියවරේ පිහිටුවා උසස් කරනු ලැබූ ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම.

10.3.4.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව -

10.3.4.1.1. සපුරාලිය යුතු සුදුසුකම් ;

(i) මෙම සේවයේ පත්වීම ස්ථිර කර තිබීම ;
(ii) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 2- II ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහ (05)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහ (05)ක් උපයාගෙන තිබීම ;
(iii) දෙවන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම ;
(iv) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර පහ (05)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම ;
(v) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.3.4.1.2. උසස් කිරීමේ ක්‍රමය -

ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 2- I ශ්‍රේණියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 2- I ශ්‍රේණියට උසස් කිරීම අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

*සටහන 9 :* සාමාන්‍ය මට්ටමේ කාර්ය සාධනය අනුව උසස් කිරීමේදී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

10.4 2- I ශ්‍රේණියේ සිට 1 පන්තියට උසස් කිරීම :

10.4.1. සාමාන්‍ය කාර්ය සාධනය අනුව ;

10.4.1.1. සපුරාලිය යුතු සුදුසුකම් ;

(i) මෙම සේවයේ පත්වීම ස්ථිර කර තිබීම,

(ii) උසස්වීම සඳහා සුදුසුකම් ලබන දිනට 2- I ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම,

(iii) තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම,

(iv) වෘත්තීය සමාලෝචනය ද ඇතුළුව අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පූර්වාසන්න වූ වසර පහ (05)ක් තුළ සතුටුදායක හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම,

(v) උසස්වීම සඳහා සුදුසුකම් ලැබීමට පූර්වාසන්න වූ වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

10.4.1.2 උසස් කිරීමේ ක්‍රමය -

සුදුසුකම් සම්පූර්ණ කරන ගුරුවරුන් 1 පන්තියට උසස් කිරීම සඳහා විදුහල්පති මගින් කොට්ඨාස/ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි 1 පන්තියට උසස් කිරීම අධ්‍යාපන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් සිදු කරනු ලැබේ.

*සටහන 10:* එක් පන්තියක/ ශ්‍රේණියක සිට ඊළඟ පන්තියට/ ශ්‍රේණියට උසස් කිරීමට අදාළව වැටුප් පරිවර්තනය ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2000 විධිවිධාන යටතේ සිදු කළ යුතු ය.

**11. සේවයට අදාළ කොන්දේසි :**

11.1 ස්ථිර කිරීමේ කොන්දේසිः
සේවයට බඳවා ගන්නා ගුරුවරයෙකු වසර තුන (3)ක පරිවාස කාලයකට යටත් වේ. වසර තුන (3)ක් අවසානයේ සේවය ස්ථිර කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ සඳහන් විධිවිධාන අනුව සිදු කරනු ලැබේ.

11.2 පුහුණුව හා සංවර්ධනය.

11.2.1. ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් හැර ගුරු සේවයට බඳවා ගන්නා සෑම අයෙකුටම දින විසි එක (21)ක සමාරම්භක පුහුණුවක් (නේවාසික) ලබා දෙනු ලැබේ.

11.2.2. විෂය මාලා සංවර්ධනයට හා සේවාස්ථ ගුරු පුහුණුවට අදාළ කාරයභාරය ඉටු කිරීමට බැඳී සිටින්නන් හැර අනෙක් සියලු ගුරුවරුන් අවම වශයෙන් සතියකට පැය පහළොව (15)ක් වත් පන්ති කාමර ඉගැන්වීම් කටයුතුවල නිරත විය යුතු ය.

11.2.3. *වෘත්තීය සමාලෝචනය :*

(අ) වෘත්තීය සමාලෝචනය අධීක්ෂණ කණ්ඩායමක් විසින් සිදු කරනු ලැබේ. සමාලෝචනයට භාජනය වන කාලය තුළ අධීක්ෂණ නිලධාරීන් විසින් යටත් පිරිසෙයින් තුන් වතාවක්වත් ගුරුවරයාගේ වැඩ කටයුතු සමාලෝචනයට භාජනය කරනු ලැබේ. මෙහි ලා පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

(i) ඒ ඒ ගුරුවරයාගේ සමාලෝචනයට ලක්වන කාල සීමාවට ඇතුළත් සේවා වාර්තා හා සටහන්

(ii) අදාළ කාල සීමාව තුළ ගුරුවරයාගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම් වාර්තා

(iii) ගුරුවරයාගේ පන්ති කාමර ඉගැන්වීම් පිළිබඳව අධීක්ෂණ කණ්ඩායම විසින් කරනු ලබන තක්සේරුව

(ආ) වෘත්තීය සමාලෝචනය සිදු කිරීමෙන් අනතුරුව ගුරුවරයාගේ තත්ත්වය පිළිබඳ ව අසතුටුදායකයි/ සතුටුදායකයි/ හොඳයි/ ඉතා හොඳයි වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

(ඇ) වෘත්තීය සමාලෝචනය සඳහා යොදා ගනු ලබන වාර්තා සහතික හා සටහන් ආදියට අදාළ වන ආකෘති පත්‍ර සහ එම ආකෘති පත්‍ර සම්පූර්ණ කිරීමේ උපදෙස් ඇතුළු වෘත්තීය සමාලෝචනය පැවැත්විය යුතු ආකාරය පිළිබඳ උපදෙස් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව රේඛීය අමාත්‍යාංශ ලේකම් විසින් අවශ්‍ය වන පරිදි විටින් විට නිකුත් කරනු ලැබේ.

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසි අදාළ වේ. මෙම ව්‍යවස්ථාවෙහි සඳහන් විධිවිධානවලට පරිබාහිර වූ කරුණු පිළිබඳ තීරණය ගැනීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

**13. අර්ථ නිරූපණ හා නිර්වචන :**

13.1 "ව්‍යවස්ථාව" යනුවෙන් ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අදහස් කෙරේ.

13.2 "රාජ්‍ය සේවා කොමිෂන් සභාව" යනුවෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාවේ සඳහන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව අදහස් කෙරේ.

13.3 "පත් කිරීම් බලධාරියා" යනු රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරා ඇති අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වේ.

13.4 වෙනත් අයුරකින් සුවිශේෂ කොට සඳහන් කර නැත්නම් "සේවය" යනුවෙන් ශ්‍රී ලංකා ගුරු සේවය අදහස් කෙරේ.

13.5 "අමාත්‍යාංශය" යන්නෙන් සමාන්‍ය අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය අදහස් කෙරේ.

13.6 ''අධීක්ෂණ කණ්ඩායම" යන්නෙන් නිසි හා විධිමත් අධීක්ෂණය පවත්වා ගැනීම සඳහා සම්පාදිත රීති සහ නියෝග ප්‍රකාරව පාසලේ විදුහල්පති/ නියෝජ්‍ය විදුහල්පති/ සහකාර විදුහල්පති අදාළ විෂය පිළිබඳ ගුරු උපදේශක සමග විෂය පිළිබඳ නිපුනතා ඇති පළමුවන පංතියේ හෝ ජ්‍යෙෂ්ඨ ගුරුවරුන්ගෙන් සමන්විත කණ්ඩායමක් වේ.

13.7 ''උපාධිධාරියා" යනුවෙන් අදහස් කරන්නේ, අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් ගුරු පත්වීම්වලට අදාළව පිළිගත් සුවිශේෂි කරන ලද විෂය ක්ෂේත්‍රවලට අයත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ලබා ගත් උපාධි සුදුසුකම් සහතිකය ලත් පුද්ගලයෙකු වේ.

13.8 ''අධ්‍යාපනවේදී උපාධිධාරියා" යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ලබා ගත් අධ්‍යාපනවේදී සුදුසුකම් සහතිකයක් ලත් පුද්ගලයෙකු වේ.

13.9 ''ගුරු පුහුණුධාරියා" යනුවෙන් අදහස් කරන්නේ.

(අ) රජයේ විද්‍යාපීඨයක තෙවසරකට නොඅඩු ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක් (ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක්) සාර්ථක ලෙස සම්පූර්ණ කර සහතික පත්‍රය ලද පුද්ගලයෙකු

හෝ

(ආ) අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දෙවසරකට නොඅඩු වූ ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සහතික පත්‍රය ලද පුද්ගලයෙකු

හෝ

(ඇ) අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද හා දුරස්ථ ක්‍රමය මගින් තෙවසරකට නොඅඩු ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර සහතික පත්‍රය ලද පුද්ගලයෙකු වේ.

13.10 ''ශික්ෂණ විද්‍යා පුහුණුව ලද උපාධිධාරියා" යනුවෙන් අදහස් කරන්නේ.

(i) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සුදුසුකම් සහිත 13.7 හි විස්තර කරන ලද උපාධිධාරියා

හෝ

(ii) ඉහත 13.9(අ) හි සඳහන් සුදුසුකම් සහිත 13.8 හි විස්තර කරන ලද උපාධිධාරීන්

හෝ

(iii) ඉහත 13.9 (ආ) හි සඳහන් සුදුසුකම් ලබා ඇති 13.7හි විස්තර කරන ලද උපාධිධාරියා

13.11 ''ඩිප්ලෝමාධාරියා" යනුවෙන් අදහස් කරන්නේ 13.14 හි සඳහන් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක් නොවන්නා වූ ද, අදාළ කාරණය සඳහා අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ආයතනයක් විසින් පිරිනමනු ලබන්නා වූ ද, දෙවසරකට නො අඩු පාඨමාලා කාල පරාසයක් සහිත වූ ද, ජාතික වෘත්තීය කුසලතා මට්ටම් හය (6)ට නො අඩු තරාතිරමක වූ ද, ඩිප්ලෝමා පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කළ සහතික ලත් පුද්ගලයකු වේ.

13.12 ''පුහුණු ඩිප්ලෝමාධාරියා" යනුවෙන් අදහස් කරන්නේ 13.11හි සඳහන් ඩිප්ලෝමා පාඨමාලාවක් සහ 13.9 හි සඳහන් ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා සම්පූර්ණ කළ සහතික ලත් පුද්ගලයකු වේ.

13.13 ''අ.පො.ස. (උසස් පෙළ) සුදුසුකම්ලාභියා" යනුවෙන් අදහස් කරන්නේ අ.පො.ස. (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වූ පුද්ගලයෙකු වේ.

13.14 ''පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව"යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන විෂය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව වේ.

13.15 ''අධ්‍යාපන පශ්චාත් උපාධියක්'' යනුවෙන් අදහස් කරන්නේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් විසින් පිරිනමනු ලබන අධ්‍යාපන විෂය පිළිබඳ පශ්චාත් උපාධියක් වේ.

13.16 ''සක්‍රීය සේවා කාලය'' යනු සක්‍රීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියේ (ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියෙහි) යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත කාල පරිච්ඡේද සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලැබේ.

13.17 ''ලේකම්'' යනුවෙන් අදහස් කරන්නේ අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් වේ.

13.18 ''පාසල් පාදක ක්‍රමය'' යනුවෙන් අදහස් කරන්නේ බඳවා ගැනීමේ ගැසට් නිවේදනයේ පාසල් අනුව පුරප්පාඩු පළ කිරීම මගින් එම පාසලට අදාළව ඉල්ලුම්පත් කැඳවා අදාළ පාසලටම බඳවා ගැනීමේ ක්‍රමවේදය වේ.

13.19 ''ගුරු පුහුණු සහතිකය'' යනුවෙන් අදහස් කරන්නේ –

(අ) අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දෙවසරකට නොඅඩු වූ ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක්

හෝ

(ආ) අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දුරස්ථ ක්‍රමය මගින් තෙවසරකට නොඅඩු ගුරු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස සම්පූර්ණ කර ලබා ගනු ලබන සහතික පත්‍රය වේ.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :**

මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින ගුරුවරුන් ප්‍රතිසංවිධිත ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථාවට අනුව අන්තර්ග්‍රහණය කිරීම පහත දැක්වෙන පරිදි සිදු කරනු ලැබේ.

14.1. සේවයේ 3- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
සේවයේ 3- II ශ්‍රේණියේ සිටින පත්වීමට අදාළව නියම කර ඇති අධ්‍යාපන සුදුසුකම් සහිත ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-II ශ්‍රේණියට ද,

14.2 සේවයේ 3- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
(අ) සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ව්‍යවස්ථාවේ 7.2.2.1 (ආ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3- I (ඇ) ශ්‍රේණියට ද,
(ආ) සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ව්‍යවස්ථාවේ 7.2.2.1 (ඇ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3- I (ආ) ශ්‍රේණියට ද,
(ඇ) සේවයේ 3- I ශ්‍රේණියේ සිටින ව්‍යවස්ථාවේ 7.2.2.1 (ඇ) හි සඳහන් සුදුසුකම් සහිත ගුරුවරුන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3- I (අ) ශ්‍රේණියට ද,
අන්තර්ග්‍රහණය කළ යුතු ය.

14.3 සේවයේ 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
සේවයේ 2- II ශ්‍රේණියේ සිටින ගුරුවරුන්
ශ්‍රී ලංකා ගුරු සේවයේ 2- II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතු ය.

14.4 සේවයේ 2- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
සේවයේ 2- I ශ්‍රේණියේ සිටින ගුරුවරුන්
ශ්‍රී ලංකා ගුරු සේවයේ 2- I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ යුතු ය.

14.5 සේවයේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම
සේවයේ I පන්තියේ සිටින ගුරුවරුන්
ශ්‍රී ලංකා ගුරු සේවයේ I වන පන්තියට අන්තර්ග්‍රහණය කළ යුතු ය.

*සටහන 11:* අන්තර්ග්‍රහණය කිරීම මත වැටුප් පරිවර්තනය කිරීම, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(VIII) උපලේඛනයේ (ii) හි සඳහන් පරිවර්තන වගුව සහ චක්‍රලේඛයේ 3.3 ඡේදය යටතේ සිදු කළ යුතු ය. අන්තර්ග්‍රහණය හේතුවෙන් වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවේ.

**15. අන්තර්කාලීන විධිවිධාන :**

(අ) මෙම ව්‍යවස්ථාව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන දිනයේ සිට වසර තුන(3)ක් තුළ ශ්‍රේණියේ උසස්වීම් ලබා දීමේ කාර්යය සඳහා සේවා කාලය සහ අනෙකුත් අවශ්‍යතා හැර වෘත්තීය සමාලෝචනය සහ කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. එම කාලය තුළ අනෙකුත් අවශ්‍යතා සම්පූර්ණ කරන ගුරුවරුන්හට වෘත්තීය සමාලෝචනය සහ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කිරීම නොසලකා එම උසස්වීම් ලබා දෙනු ලැබේ.

(ආ) මෙම සේවා ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුව සිටින වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයසට එළඹ නැති නිලධාරියෙකු හට ඔහු/ඇය විසින් කරනු ලබන ඉල්ලීමක් මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ හත (7) වැනි වගන්තිය යටතේ සේවයෙන් විශ්‍රාම ගැනීමේ මනාපය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. එවන් සහනයක් පිරිනැමිය යුතු තරමට මෙම සේවා ව්‍යවස්ථාවේ විධිවිධානවලින් අහිතකර බලපෑමක් ඇති වී ඇතැ යි එම නිලධාරියා අදහස් කරන්නේ නම් එම ඉල්ලීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වසර පහ (05)ක් තුළ ඉදිරිපත් කළ යුතු ය. ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව සෑහීමකට පත්වන්නේ නම් පමණක් එම ඉල්ලීමට ඉඩ ලබා දෙනු ලැබේ.

"අ" පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ලිඛිත තරග විභාගය පිළිබඳ විස්තර.

**1. මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.**

| | | |
|---|---|---|
| (i) | අභියෝග්‍යතා පරීක්ෂණය | - කාලය පැය 01 (ලකුණු 100) |
| (ii) | සාමාන්‍ය දැනීම | - කාලය පැය 01 (ලකුණු 100) |

ලිඛිත විභාගය සමත් වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා අවම වශයෙන් ලකුණු 40 බැගින් ලබාගෙන විෂයයන් දෙකම සමත් විය යුතු ය.

**2. විභාග පරිපාටිය :**

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන් ගෙන් පැවැත්වේ.
(ii) සෑම අපේක්ෂකයෙකුම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතු ය.
(iii) අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙක (02)ටම පෙනී සිටිය යුතු ය.
(v) වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

**3. විෂය නිර්දේශය :**

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය.

අපේක්ෂකයා සතු ගුරු වෘත්තීය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත ය. එම ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු සැපයිය යුතු ය.

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම.

ගුරු ක්ෂෙත්‍රයට අදාළව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/ හෝ දේශීය වශයෙන් සිදු වී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

"ආ" පරිශිෂ්ඨය

ශ්‍රී ලංකා ගුරු සේවයට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණය පිළිබඳ විස්තර.

**1. ප්‍රායෝගික පරීක්ෂණය :**

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතු ය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ.

| අනු අංකය. | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක. | උපරිම ලකුණු ප්‍රමාණය. | සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අරමුණ හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02. | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |
| 03. | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 04. | කාල කළමනාකරණය. | 05 | 02 |
| 05. | ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | 10 |

**2. ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය :**

(i) ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කාලය විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
(ii) ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25)කි.
(iii) ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතු ය.
(iv) ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම අධ්‍යාපන විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

**3. නිර්ණායකයන්හි අරමුණ :**

(i) අරමුණ හා ප්‍රවිශ්ට වීම.
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.
(ii) පෞරුෂය හා හඬ පාලනය.
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.
(iii) සන්නිවේදනයේ පැහැදිලි බව.
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.
(iv) කාල කළමනාකරණය.
ලබා දෙනු ලබන කාලසීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.
(v) ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම.

"ඇ" පරිශිෂ්ඨය

**ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් ...... පන්තිය/ ...... ශ්‍රේණිය සිට ..... පන්තියට/ ..... ශ්‍රේණියට උසස් කිරීම/ පත් කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය.**

01.
(i) ගුරුවරයා/ ගුරුවරියගේ සම්පූර්ණ නම: ............................................................... ............................................ ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මයා/ මිය/ මෙනවිය
(ii) ගුරුවරයා/ ගුරුවරියගේ මුලකුරු සමග නම: ....................................................... ...............................................ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මයා/ මිය/ මෙනවිය
(iii) නම වෙනස් කොට ඇත්නම් පළමුව භාවිතා කළ නම: ........................................ ............................................ ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මයා/ මිය/ මෙනවිය
(iv) ලියාපදිංචි අංකය (තිබේ නම්): ....................................................................
(v) උපන් දිනය: වර්ෂය :- ........................ මාසය :- .......... දිනය :- .............
(vi) වයස අවු. 60ට එළඹී/ එළඹෙන දිනය:- වර්ෂය : ........... මාසය : .......... දිනය :......

(vii) විශ්‍රාමික නම් විශ්‍රාම ලැබූ දිනය:- වර්ෂය : ............. මාසය :.......... දිනය : ............

02. ජාතික හැඳුනුම්පත් අංකයඃ ...................................................................
03. පෞද්ගලික ලිපිනයඃ ............................................................................
දුරකතන අංකයඃ ...................................................................................

04. (අ) සේවයේ යෙදී සිටී නම්,
(i) වර්තමානයේ සේවය කරන පාසලේ නම හා ලිපිනයඃ ....................................
.........................................................................................................
(ii) වර්තමානයේ ගුරු සේවයේ ශ්‍රේණිය/ පන්තියඃ ...............................................
(iii) එම ශ්‍රේණියට/ පන්තියට පත් වූ/ උසස් වූ දිනයඃ ............................................

(ආ) විශ්‍රාමික නම්ඃ
(i) අවසන්වරට සේවය කරන ලද පාසලේ නම හා ලිපිනය :.............................................
.........................................................................................................
(ii) විශ්‍රාම ගන්නා විට ගුරු සේවයේ සිටි ශ්‍රේණිය/ පන්තියඃ ................................
(iii) එම ශ්‍රේණියට පන්තියට පත් වූ/ උසස් වූ දිනයඃ ...........................................

05. විදුහල අයත් කලාප අධ්‍යාපන කාර්යාලය : .............................................

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

(i) මෙම ව්‍යවස්ථාවේ සඳහන් ශ්‍රී ලංකා ගුරුසේවයට අදාළව ලබා ඇති අධ්‍යාපන සුදුසුකම්.

| ආයතනය | පාඨමාලාව | කාල සීමාව | බාහිර/ අභ්‍යන්තර පාඨමාලාවක් ද යන වග | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

(ii) මෙම ව්‍යවස්ථාවේ සඳහන් ශ්‍රී ලංකා ගුරු සේවයට අදාළව ලබා ඇති වෘත්තීය සුදුසුකම් :

| ආයතනය | පාඨමාලාව | සුදුසුකම | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|
| | | | |
| | | | |

07. සේවා සටහනඃ (ආධුනික/ අභ්‍යාසලාභී සේවා කාලයක් ඇත්නම් පමණක් මෙය අදාළ වේ.)

| විද්‍යාලය/ ආයතනය | කලාපය/ කොට්ඨාසය | ශ්‍රේණිය/ පන්තිය | කාලය | |
|---|---|---|---|---|
| | | | සිට | දක්වා |
| (i) | | | | |
| (ii) | | | | |
| (iii) | | | | |
| (iv) | | | | |

07.1.
(i) මුල් පත්වීම් පදනමඃ (ස්ථිර/ ආධුනික/ අභ්‍යාසලාභී/ ගුරු සහායක)
(ii) මුල් පත්වීම් ලිපියේ යොමු අංකයඃ .....................................................................

(iii) මුල් පත්වීම ලබා දී ඇත්තේ කවුරුන් විසින් ද යන වග: ......................................

07.2.

(i) ස්ථිර විශ්‍රාම වැටුප් සහිත පළමු පත්වීම ලැබූ දිනය: .....................................................
(ii) තනතුරේ ස්ථිර කර තිබේ ද: (ඔව්/ නැත)
(iii) ස්ථිර කර ඇත්නම් ස්ථිර කළ ලිපියේ යොමු අංකය: ....................................................
දිනය: ................................................................

07.3

(i) 1994.10.06 දින ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පන්තිය: ............................
ශ්‍රේණිය: ...........................

(ii) එදිනට පිහිටවන ලද වැටුප් පරිමාණය: .......................................................................

වැටුප් පියවර: .............................................................................

(iii) 1994.10.06 දින හෝ පසුව වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරට පැමිණියේ නම් පැමිණි
දිනය: ..........................................................................................................
එම පියවර: ..............................................................................................................

(iv) 2008.07.01 දින ශ්‍රී ලංකා ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පන්තිය: ......................
ශ්‍රේණිය: ......................

(v) එදිනට පිහිටුවන ලද වැටුප් පරිමාණය: ...................................................................

වැටුප් පියවර: ..........................................................................

(vi) 2008.07.01 දින හෝ පසුව වැටුප් පරිමාණයේ උපරිම වැටුප් පියවරට පැමිණියේ නම් පැමිණි
දිනය: ...........................................................................................................
එම පියවර: ..................................................................................................................
(vii) 2010.12.31 දින ශ්‍රී ලංකා ගුරු සේවයට උසස් කළ පන්තිය: ......................
ශ්‍රේණිය: ......................
(viii) එදිනට පිහිටුවන ලද වැටුප් පරිමාණය: ...................................................................
වැටුප් පියවර: ..........................................................................
(ix) පුහුණු ගුරුවරයෙකු ලෙස පත්වීම් ලැබූ දිනය: ..........................................................
(x) උපාධිධාරී ගුරුවරයෙකු ලෙස පත්වීම් ලැබූ දිනය: ...................................................
(xi) ඩිප්ලෝමාධාරී ගුරුවරයෙකු ලෙස පත්වීම් ලැබූ දිනය: ...............................................
(xii) නුපුහුණු ගුරුවරයෙකු ලෙස පත්වීම් ලැබූ දිනය: .......................................................
(xiii) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකය ලබා තිබේ ද: (ඔව්/ නැත)
(xiv) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකය වලංගු දිනය: .....................................
(xv) අධ්‍යාපන පශ්චාත් උපාධිය ලබා තිබේ ද: (ඔව්/ නැත)
(xvi) අධ්‍යාපන පශ්චාත් උපාධිය වලංගු දිනය: ..................................................................

08.වැටුප් රහිත නිවාඩු ලබා තිබේ ද: (ඔව්/ නැත)

තිබේ නම් කාල පරිච්ඡේදය: .................................. දින සිට ................................ දින දක්වා
(වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද නිවාඩු වාර්තාවේ/ අනුලිපියේ පිටපතක් අමුණන්න)

09. සේවා කඩවීමක් සිදු ව ඇත් ද: (ඔව්/ නැත)

10. (i) කිසියම් විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනා ලබා ඇත් ද: (ඔව්/ නැත)
(ii) චෝදනා ලබා ඇත්නම් විනයානුකූලව කටයුතු කර තිබේ ද: (ඔව්/ නැත)
(iii) එසේ නම් විනයානුකූලව කටයුතු කිරීමට අදාළව නිකුත් කර ඇති පරීක්ෂණ තීන්දුවේ පිටපතක් අමුණන්න.

11. සාමාන්‍ය කාර්යසාධනය යටතේ ...... පන්තියට/ ශ්‍රේණියට උසස්වීම්/ පත් කිරීම් සඳහා සුදුසුකම් ලබන දිනයඃ ..........................................................................................................................

12. පන්තියට/ ශ්‍රේණියට සුදුසුකම් ලබන දිනයට පූර්වාසන්න වසර .... තුළ වැටුප් වර්ධක උපයා ගැනීම් හා ලබාගෙන ඇති කාර්යසාධන මට්ටම් :

| *අනු අංකය* | *වර්ෂය* | *වැටුප් වර්ධක උපයාගෙන ඇත/ නැත* | *කාර්යසාධන මට්ටම* |
|---|---|---|---|
| 01 | | | |
| 02 | | | |
| 03 | | | |
| 04 | | | |
| 05 | | | |
| 06 | | | |
| 07 | | | |

13. කාර්යක්ෂමතා කඩඉම:

| *කාර්යක්ෂමතා කඩඉම* | *ශ්‍රේණිය* | *කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ කාලසීමාව* |
|---|---|---|
| | | |
| | | |
| | | |

මෙම අයදුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව සහතික කරමි. මෙහි සඳහන් කර ඇති තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා උසස් කිරීමට පෙර හෙළිදරව් වුවහොත් මා නුසුදුස්සෙකුවීමට යටත් බවත්, උසස් කිරීමෙන්/ පත් කිරීමෙන් පසු හෙළිදරව් වුවහොත් උසස්වීම අවලංගු කිරීමට යටත් වන බවටත් මම එකඟ වෙමි.

.................................
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය ඃ

---

*කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,*

ඉහත සඳහන් ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මහතා/ මහත්මිය/ මෙනවිය මෙම විදුහලේ දින සිට සේවය කරන බවත් හා හැසිරීම සතුටුදායක බවත්, වැටුප් රහිත නිවාඩු කිසිවක් ලබා නොමැති බවත්, කිසියම් විෂම ක්‍රියාවක් සම්බන්ධයෙන් චෝදනා ලබා නොමැති බවත් සහතික කරමි. සුදුසුකම් පරීක්ෂා කිරීමට සහ මෙම ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මොහු/ මැය ............................. දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ .......... ශ්‍රේණියේ/ පන්තියේ ..... ශ්‍රේණියට/ පන්තියට උසස් කිරීමට/ පත් කිරීමට නිර්දේශ කරමි. පහත සඳහන් හේතූන් මත උසස් කිරීම/ පත්කිරීම නිර්දේශ නොකරමි.

විදුහල්පතිගේ අත්සන
(නිල මුද්‍රාව තබන්න)

දිනය ඃ

යොමු අංකය

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,

(අ) ............................................................ ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මහතා/ මහත්මිය/ මෙනවියගේ
(ආ) ඉහත 1 සිට 12 දක්වා වූ තොරතුරු නිවැරදි ය.
(ඇ) (i) වැඩ හා හැසිරීම සතුටුදායකය/ සතුටුදායක නොවේ.
(ii) වැටුප් රහිත නිවාඩු ලබා නොමැත/ ලබා ඇත.
(iii) විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් චෝදනා ලබා ඇත/ නොමැත. චෝදනා ලැබුවද පරීක්ෂණයෙන් නිදහස් වී ඇත/ නැත.
(iv) තනතුරේ ස්ථිර කර ඇත/ නැත.
(v) වැටුප් වර්ධක අත්හිටුවීමක් හෝ විලම්බනය කිරීමක් හෝ නතර කිරීමක් සිදුකොට ඇත/ නැත.

(ඈ) ඉහත නම සඳහන් ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මහතා/ මහත්මිය/ මෙනවිය, ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව ............................ දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ ........ ශ්‍රේණියේ/ පන්තියේ ....... ශ්‍රේණියට/ පන්තියට උසස් කිරීම/ පත් කිරීම නිර්දේශ කරමි./ පහත සඳහන් හේතුන් මත උසස් කිරීමට/ පත් කිරීමට නිර්දේශ නොකරමි.

දිනය : ................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ අතිරේක කලාප
අධ්‍යාපන අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව තබන්න)

---

යොමු අංකය

අධ්‍යාපන ලේකම්
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය
ශ්‍රී ලංකා ගුරු සේවයේ තනතුර දරන ................................................................................. ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මහතා/ මහත්මිය/ මෙනවිය .................................. දින සිට ශ්‍රී ලංකා ගුරු සේවයේ ...... ශ්‍රේණියේ/ පන්තියේ ...... ශ්‍රේණියට/ පන්තියට උසස් කිරීම/ පත් කිරීම නිර්දේශ කරමි./ පහත සඳහන් හේතුන් මත උසස් කිරීමට/ පත් කිරීමට නිර්දේශ නොකරමි.

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
(නිල මුද්‍රාව තබන්න)

දිනය : ................

අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා

යොමු අංකය

......................................................................................... ස්වාමීන් වහන්සේ/ පූජකතුමා/ මහතා/ මහත්මිය/ මෙනවිය ශ්‍රී ලංකා ගුරු සේවයේ ......... ශ්‍රේණියේ/ පන්තියේ ........ ශ්‍රේණියට/ පන්තියට උසස් කර/ පත් කර පත්වීම් ලිපි නිකුත් කිරීම අනුමත කරමි./ පහත සඳහන් හේතුන් මත උසස් කිරීම/ පත් කිරීම අනුමත නොකරමි.

ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
(නිල මුද්‍රාව තබන්න)

"ඇ" පරිශිෂ්ඨය

මොඩියුල 01 ආයතන සංග්‍රහයේ ගුරුවරයෙකුට අදාළ මූලික කරුණු හා රාජ්‍ය සේවකයෙකු දැනගත යුතු මූලික කරුණු හා මුදල් රෙගුලාසිවල සරල කරුණු (සවිස්තරව විෂය අන්තර්ගතව සකස් කෙරේ)
මොඩියුල 02 ගුරු ආචාර ධර්ම
මොඩියුල 03 පන්ති කාමර කළමනාකරණය හා සිසුන් හඳුනා ගැනීම
මොඩියුල 04 ඉදිරිපත් කිරීම් ශිල්ප ක්‍රම (ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද ඇතුළුව)

මොඩියුල 05 දින සටහන් සති සටහන් වාර සටහන් හා පාඩම් සටහන් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම
මොඩියුල 06 ඵලදායිතා හා තත්ව ශිල්ප ක්‍රම
මොඩියුල 07 අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය
මොඩියුල 08 අධ්‍යාපනයට සම්බන්ධ අණ පනත් හා අධ්‍යාපන ඉතිහාසය
මොඩියුල 09 ව්‍යවහාරික ඉංග්‍රීසි
මොඩියුල 10 විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල් ව්‍යාපෘති
මොඩියුල 11 කාර්යාල ක්‍රම හා අනෙකුත් ආයතන සමග සන්නිවේදන සබඳතා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි සහ කළමනාකරණ තීරණ ගැනීම
මොඩියුල 12 ළමා සෞඛ්‍ය හා පෝෂණය
මොඩියුල 13 ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපන දැනුම
මොඩියුල 14 මනෝවිද්‍යා උපදේශනය
මොඩියුල 15 අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින සංවිධාන ව්‍යුහය, ඒ සඳහා සබඳතා පැවැත්වීම, උසස් අධ්‍යාපනය, තෘතිය අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය
මොඩියුල 16 පර්යේෂණ ඇගයීම් හා පර්යේෂණ ක්‍රම
මොඩියුල 17 අන්තර්පුද්ගල සබඳතා හා ආකල්ප කුසලතා සංවර්ධනය
මොඩියුල 18 මානව සම්පත් කළමනාකරණය
මොඩියුල 19 නොවිධිමත් අධ්‍යාපනය හා මෘදු කුසලතා
මොඩියුල 20 කාල කළමනාකරණය හා වෘත්තීය මාර්ගෝපදේශනය

2 පන්තිය II ශ්‍රේණියට සෘජුව බඳවාගත් ගුරුවරුන් සඳහා පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ii)

මොඩියුල 01 ආයතන සංග්‍රහයේ ගුරුවරයෙකුට අදාළ මූලික කරුණු හා රාජ්‍ය සේවකයෙකු දැනගත යුතු මූලික කරුණු හා මුදල් රෙගුලාසිවල සරල කරුණු (සවිස්තරව විෂය අන්තර්ගතව සකස් කෙරේ) සහ ගුරු ආචාර ධර්ම
මොඩියුල 02 ඵලදායිතා හා තත්ව ශිල්ප ක්‍රම
මොඩියුල 03 අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණය පන්ති කාමර කළමනාකරණය හා සිසුන් හඳුනා ගැනීම
මොඩියුල 04 ව්‍යවහාරික ඉංග්‍රීසි
මොඩියුල 05 දින සටහන් සති සටහන් වාර සටහන් හා පාඩම් සටහන් පිළියෙල කිරීම හා පවත්වාගෙන යාම
මොඩියුල 06 ඉදිරිපත් කිරීම් ශිල්ප ක්‍රම (ප්‍රායෝගික ක්‍රියාකාරකම් ද ඇතුළුව)
මොඩියුල 07 කාර්යාල ක්‍රම හා අනෙකුත් ආයතන සමග සන්නිවේදන සබඳතා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි සහ කළමනාකරණ තීරණ ගැනීම

සටහන - මෙම මොඩියුල ක්‍රියාත්මක කිරීම අන්තර්ග්‍රහණයේ සිට වසර 02 කට පසුව ආරම්භ කරනු ලැබේ.මුල් වසර 02 තුළ සම්බන්ධීකරණ නිළධාරීන් හඳුනා ගැනීම දේශකයන් හඳුනා ගැනීම ආදී පූර්ව සංවිධාන කටයුතු නිම කළ යුතු ය. (මොඩියුල ක්‍රියාත්මක වන ක්‍රමවේදය -උප ලේඛනය 1 බලන්න)

*උපලේඛන 1*

*මොඩියුල ක්‍රියාත්මක වන ක්‍රමවේදය*

මෙම මොඩියුල ගුරු පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍ර කොට ගෙන ක්‍රියාත්මක කෙරේ.
එක් ගුරු පුහුණු මධ්‍යස්ථානයකට මෙම මොඩියුල සම්බන්ධීකරණය සහ පවත්වා ගෙන යාම සඳහා පුහුණුකරු හා සම්බන්ධීකරණ නිළධාරීන් තුන්දෙනෙකු යොදවනු ඇත.

එක් සම්බන්ධිකරණ නිළධාරියෙකු මොඩියුල 1-7 දක්වා ද අනෙක් සම්බන්ධීකරණ නිළධාරියා මොඩියුල 8-14 දක්වා ද ඊළඟ සම්බන්ධීකරණ නිළධාරියා මොඩියුල 15-20 දක්වා ද පැවත්වීමේ වගකීම දැරිය යුතු ය.

එහි දී ඒ ඒ මොඩියුල සම්බන්ධයෙන් විශේෂ නිපුණතාවයක් එකී නිලධාරියාට නොමැති අවස්ථාවල දී ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳව ප්‍රවීණයන් බාහිර දේශකයන් වශයෙන් යොදා ගත හැකි ය. දේශන පැය සඳහා ගෙවීමේ දී රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය විසින් අනුමත කරගන්නා ලද ගාස්තු ප්‍රමාණ ගෙවිය යුතු ය.

සෑම සතියකම දින දෙකකින් සමන්විත වන මොඩියුලය බැගින් මාස 06 ක් තුළ නියමිත මොඩියුල පවත්වා අවසන් කළ යුතු වේ.

සම්බන්ධීකරණ නිලධාරීන් තිදෙනෙක් සිටින බැවින් මාස 06ක් තුළ මොඩියුල 20ම සම්පූර්ණ කළ හැකි වේ. එහෙයින් වසරක දී මෙවැනි මොඩියුල පවත්වා සම්පූර්ණ කිරීමේ වැඩසටහන් දෙවතාවක් සංවිධානය කළහැකි වේ.සෑම මොඩියුලයක් අවසානයේදී ම එම මොඩියුලය සාර්ථකව නිම කළ බව තක්සේරු කිරීම සඳහා පැයක ප්‍රශ්න පත්‍රයකට පුහුණුවන්නා පෙනී සිටිය යුතු අතර එම ප්‍රශ්න පත්‍රය ඉතාම සරල මට්ටමින් (බහුවරණ හෝ ව්‍යුහගත)විය යුතු ය. (රචනා ශෛලීය ප්‍රශ්න ලබා නොදිය යුතු ය) උත්තර පත්‍ර අවසානයේ දීම පරීක්ෂා කොට පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කළ බව දන්වන සහතිකය එම අවස්ථාවේ ම ලබා දිය යුතු ය.

වරකට එක් මොඩියුලයක් සඳහා ගුරුවරුන් 50 ක් යොදා ගත යුතු ය.
ඒ සඳහා ගුරු මධ්‍යස්ථානයේ ඉඩකඩ නොමැති අවස්ථාවක දී ඊට ආසන්න පොදු ගොඩනැගිලි යොදා ගැනීමේ හැකියාව ඇත.

මධ්‍යස්ථානයට පත් කරන සම්බන්ධීකරණ කාර්යය සඳහා පුහුණු වන එක් ගුරුවරයෙකුට රු 5 (කාලීනව සංශෝධනය විය හැකිය.) බැගින් වූ දීමනාවක් සම්බන්ධීකරණයට ගෙවිය හැකි ය.

මෙම සම්බන්ධීකරණ නිලධාරියා සුදුසුකම් හා පලපුරුද්ද ඇති ගුරු සේවයේ 1 පන්තියේ නිළධාරියෙකු හෝ අධ්‍යාපනයට සම්බන්ධ අනෙකුත් සේවාවන්හි නිලධාරියෙකු වන අතර ඔවුන් වසර 3ක කාලයකට පමණක් අනුයුක්ත කරනු ලැබේ. ඔවුන් තෝරා ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කරනු ඇත. එය සරල අභියෝග්‍යතා හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ. මෙම සම්බන්ධීකරණ නිලධාරියා නව තනතුරු ඇති කිරීමක් නොව දැනට ගුරු සේවයේ 1 පන්තියේ සිටින තනතුරක් අතරින් තෝරා ගනු ලබන්නන් වේ.

11 - 140

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.